[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

Matugama Education Zone

| දෙවන වාර ඇගයීම - 2023 | | | |
|---|---|---|---|
| 11 වන ශ්‍රේණිය | විෂයය - නර්තනය | පත්‍රය 1 | පැය 1 |

නම :- ……………………………………………………………………………

විශේෂ උපදෙස් :-

- සියලුම අයදුම්කරුවන් 1 වන කොටසේ ප්‍රශ්න 30 ටම පිළිතුරු සැපයිය යුතුයි. එයට අමතරව II උඩරට නර්තනය හෝ III පහතරට නර්තනය යන කොටස් දෙකෙන් එක් කොටසකට පමණක් පිළිතුරු සැපයිය යුතුයි.
- II හා III වන කොටස් වලින් කලවමේ ප්‍රශ්ණ තෝරා නොගත යුතුයි ඔබ පිළිතුරු පසයන්නේ කුමන කොටසටදැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතුයි.

සැලකිය යුතුයි

(1) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(2) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලදී ඇති (1),(2),(3),(4), යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුරු තෝරා ගන්න.

(3) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න වල හිස්තැන් වලට සුදුසු වචන තෝරන්න.

1) නර්තනයකදී ……………..…................. උපාංග ලෙස ශරීරයේ කොටස් වෙන් කොට දැක්වේ.
i.ගුණාංග,අංග ii.ශරීරාංග පංචාංග iii.අංග ප්‍රත්‍යාංග iv.අංග,ශරීරාංග

2) ආඝාතාත්මක හා අනාඝාතාත්මක යන ලක්ෂණ 2 කම ……………..…................. ගායනා වල දක්නට ලැබේ.
i.පතල් කවි ii.නෙළුම් ගී iii.පාරු කවි iv.ටිකා සී පද

3) රිද්මයට ප්‍රධාන තැනක් දෙමින් වාචික අභිනය භාවිතා නොකරන නාට්‍ය වර්ගය………..….......... නමින් හඳුන්වයි.
i.මුද්‍රා නාට්‍ය ii.ශෛලිගත නාට්‍ය iii.ගීත නාට්‍ය iv.තාත්වික නාට්‍ය

4) ගම්පල යුගයට අයත් දේශාඨන වාර්තාකරුවෙකු ලෙස ගගගගගගගගගග හැඳින්වේ
i.ස්පිල් බර්ජන් ii.රොබට් නොක්ස් iii.ඉබන් බතූතා iv.පාහියන් භික්ෂුව

5) දේශීය නර්තන සම්ප්‍රදායන් හී බෙර වාදනයෙන් තොරව ………..…......... අභ්‍යාස කරයි.
i. පා සරඹ, මණ්ඩිපද ii. පා සරඹ, අත් සරඹ
iii. ගොඩ සරඹ, ඉලංගම් සරඹ iv.මණ්ඩි පද, දොඹින පද

6) දිවිකදුරු ද ගස එතැන තිබෙන්නේ
……….….... දිග මොහොල කපන්නේ
i.එක් වියතක් ii.තුන් වියතක් iii.පස් වියතක් iv.සත් වියතක්

7) පුරානයේ රාජ්‍ය පාලන කටයුතු වලදී සන්නිවේදන කාර්ය සඳහා …..…......... වාදනය කරනු ලැබීය
i. අණ බෙර, රණ බෙර, වද බෙර,මළ බෙර ii. රණ බෙර, පිං බෙර, මගුල් බෙර,මළ බෙර
iii. පිං බෙර, යහන් බෙර, රණ බෙර,අණ බෙර iv. හේවිසි, පිං බෙර, යහන් බෙර, රණ බෙර

8) දිවිදොස් පුවත හා සේරමාන් පුවත පාදක වූ ශාන්ති කර්මයන් වනුයේ …..….........
i. කොහොඹා කංකාරිය, කඩවර කංකාරිය ii. රට යකුම, දෙවොල් මඩුව,
iii. කොහොඹා කංකාරිය,දොවොල් මඩුව, iv. දෙවොල් මඩුව, පහන් මඩුව

9) මන්ද මානසික දරුවන්ගේ නර්තන කුසලතා ඔප් නැංවීම සඳහා එම දරුවන් සමාජ ගතකිරීම සඳහා ……........... මහත්මිය මහඟු මෙහෙවරක් සිදු කරන ලදී

i. වජිරා චිත්‍රසේන ii. ශ්‍රියානි රාජපක්ෂ

iii. අංජලිකා චිත්‍රසේන iv. මිරැන්ඩා හේමලතා

10) අට මගලේ කවි සහ මොහොලේ කවි ඇසුරුකර මෑත කාලීන ගැමි නැටුම් ක්ෂේත්‍රයට එක් වූයේ …….

i.කුලු නැටුමයි ii.වේවැල් නැටුම iii.මෝල්ගස් නැටුම iv.පන් නෙළීමේ නැටුමයි

- අංක 11 සිට 13 දක්වා ප්‍රශ්න වලට පහත දැක්වෙන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න


A


B


C

11) විතතාතත වද්‍යභාණ්ඩයක් ලෙස හඳුන්වන්නේ

i. A ii. C iii. B iv. කිසිවක් නොවේ

12) වඳුරු සම හා එළු හම යොදා ගැනෙන වාද්‍ය භාණ්ඩ පිළිවෙලින්

i. C හා B භාණ්ඩ ii. B හා C භාණ්ඩ iii. A හා C භාණ්ඩ iv.A හා Bභාණ්ඩ

13) “රුඟ කිට තත් දොම්” සහ පිං ගත ගො ගො යන බෙර පද වැයෙන්නේ

i. A හා B වාද්‍ය භාණ්ඩ වලිනි ii. B හා A වාද්‍ය භාණ්ඩ වලිනි

iii. A හා C වාද්‍ය භාණ්ඩ වලිනි iv. B හා C වාද්‍ය භාණ්ඩ වලනි

14) කරදිය, සත් පත්තිනි, සැළලිහිණිය මුද්‍රා නාට්‍ය නිෂ්පාදනය කළ ශිල්පීන් ලෙස සැලකෙන්නේ

i. චිත්‍රසේන ඩයස්, එස්. පණීභාරත, නිමල් වෙල්ගමයන්ය

ii. එස්. පණීභාරත, වජිරා චිත්‍රසේන, වසන්ත කුමාරයන්ය

iii. චිත්‍රසේන ඩයස්, එස්. පණාභීරත, ප්‍රේමකමාර එපිටවලයන්

iv. එස්. පණීභාරත, ශේෂා පලිහක්කාර, චිත්‍රසේන ඩයස්ය

15) පරාක්‍රමබාහු රජු නගර නිර්මාණයේදී නාට්‍ය ශාලා 5 ක් ඉදිකරන ලද බව සඳහන් කර ඇත්තේ

i. චූල වංශයේ ii. මහා වංශයේ iii. ධාතු වංශයේ iv. දීප වංශයේ

16) මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍ය ලෙස හැඳින්විය හැක්කේ

i. නරේන්ද්‍රසිංහ වර්ණනාව ii. පැරකුම්බා සිරිත

iii. ශ්‍රී වික්‍රමාලංකාරය iv. ඇහැලේපොල වර්ණනාව

17) “ලෙළෙනා දිගු නෙත නිලුපුලු සේයා” යන කවිය අයත් වන්නේ

i. සැළලිහිණි සංදේශයට ii. පරෙවි සංදේශයට

iii. තිසර සංදේශයට iv. හංස සංදේශයට

18) මහනුවර යුගයේ විමලධර්මසූරිය රජ කල මෙරට පැමිණ මහනුවර පෙරහැර පිළිබඳ අදහස් දක්වන ලද්දේ

i. ස්පිල් බර්ජන් විසිනි ii. රොබට් නොක්ස් විසිනි

iii. ඉබන් බතුතා විසිනි iv. ෆාහියන් භික්ෂුව විසිනි

19) විශ්මය නැමැති ස්ථායි භාවය නිරූපනය කිරීමේදී උපාංගවල ඇති වන වෙනස්කම් දැක්වෙන පිළිතුර වන්නේ

i. ඇස් අඩවන් වීම, මුව විවර වීම ii. කඳුලු සැලීම මුව විවර වීම

iii. දෑස් විහාලවීම මුව විවරවීම iv. මුහුණ රත්පැහැ වීම මුව විවරවීම

20) “සොබමන් දෙවිවරු සදෙනෙත් එතැනට” යන කවි පදය ඇතුලත් ගායනා විශේෂය වන්නේ

i. රබන් ii. කුළු iii. චාමර iv. මෝල්ගස්

21) කෝලම් ගැමි නාටකය සඳහා යොදා ගන්නා අවනද්ධ වාද්‍ය භාණ්ඩය හා ශුසිර වාද්‍ය භාණ්ඩය ලෙස නම් කල හැක්කේ

i. ගැටබෙරය හා තාලම්පට ii. යක්බෙරය හා තාලම්පට

iii. පහතරට බෙරය හා බටනලාව iv. පහතරට බෙරය හා හොරණෑව

22) තුන් තිතට තාල තැබීමේදී තාලම්පටින් නිකුත්වන ධ්වනිය වන්නේ

i. තිත් තෙයි තෙයි ii. තෙයි තෙයි තිත්

iii. තිත් තිත් තෙයි iv. තිත් තෙයි තිත්

23) පත්තිනි දෙවියන්ගේ අවසර ඉල්ලා සිදු කෙරෙන නර්තනාංගයක් වන්නේ

i. තාලම් ii. චාමර iii. සවරං iv. පන්තේරු

24) කෝලම් රංග භූමිය හා නේපත්‍යාගාරය වෙන් කරනු ලබන්නේ

i. දහඅට පාලි තොරණෙනි ii. බලි මැස්සෙනි

iii. වෙස් අත්තෙනි iv. අයිලයෙනි

25) බලි ශාන්තිකර්මයේ එන ග්‍රහ පන්ති කවියක පද කොටසක් වන්නේ

i. ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ii. සොබමන් දෙවිවරු සදෙනෙක් එතැනට

iii. අහුරු අල්ලමින් අගමුල කපාගෙන iv. නඳුන් උයන වට ඇවිද බලන්නේ

- 26 සිට 29 දක්වා ප්‍රශ්න වලට පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න

| පේලිය | A තීරය | B තීරය | C තීරය | D තීරය |
|---|---|---|---|---|
| 1 පේලිය | සම්ප්‍රදාය | පැරකුම්බා සිරිත | හන්තාන | ප්‍රශස්ති |
| 2 පේලිය | ග්‍රහ පන්ති | පඬුවස් දෙව් රජු | ලක් තැනින් කියන් | සීනිගම |
| 3 පේලිය | භාව ප්‍රකාශනය | කිරිටම් | සාත්වික අභිනය | ශ්‍රී නාමය |
| 4 පේලිය | නෙත්තිමාලය | සේරමාන් රජු | ටිකා සීපද | වෙස් මුහුණු |
| | | | | |

26) සාර්ථකව අංග රචනය කිරීමෙන් තිවූ වන්නේ

i. A තීරයේ 3 සහ D තීරයේ 2 වේ ii. D තීරයේ 4 සහ A තීරයේ 1 වේ

iii. A තීරයේ 3 සහ B තීරයේ 3 වේ iv. C තීරයේ 3 සහ A තීරයේ 3 වේ

27) කොහොඹ කංකාරි පුවතට අනුව ඌරා ගලක් බවට පත් වූයේ හා දෙවොල්මඩු පුවතට අනුව හිසේ රුදාවක් හට ගත්තේ

i. D තීරයේ 2 සහ B තීරයේ 2 වේ ii. C තීරයේ 1 සහ B තීරයේ 2 වේ

iii. C තීරයේ 1 B තීරයේ 4 වේ iv. D තීරයේ 2 සහ B තීරයේ 1 වේ

28) B – 1 සහ D – 3 මගින් දැක්වෙන සාම්ප්‍රදායික ගායන විශේෂය වන්නේ

i. A තීරයේ 2 ii. D තීරයේ 1 iii. C තීරයේ 4 iv. C තීරයේ 2

29) දේශීය හා විදේශීය රංග සම්ප්‍රදායන්හි ශීර්ෂාභරණ අනු පිළිවෙලින් දැක්වෙනුයේ

i. 4 පේළිය D තීරය සහ 3 පේළිය B තීරුවෙනි

ii. 3 පේළිය D තීරය සහ 4 පේළිය A තීරුවෙනි

iii. 4 පේළිය D තීරය සහ 4 පේළිය A තීරුවෙනි

iv. 4 පේළිය A තීරය සහ 3 පේළිය B තීරුවෙනි

30) යහපත් දිවි පැවැත්මක් උදෙසා නර්තන කලාව හා සම්බන්ධ සාරධර්මයක් නොවන්නේ
   i. නර්තන තරඟාවලින් සඳහා දායකත්වය දැක්වීම
   ii. ගුරු දෙපා නැමදීම හා ජ්‍යෙෂ්ඨ ශිල්පීන්ට ගරු කිරීම
   iii. දෙවි දේවතාවුන්ගෙන් ගුරුන්ගෙන් අවසර ගැනීම
   iv. රංග භාණ්ඩ රංග වස්ත්‍රාභරණ සඳහා ගරු කිරීම

## උඩරට නර්තනය

31) "තකුඳ තකුතක තකට කුංදත්" මෙය
   i. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් සීරුමාරුවක කොටසකි
   ii. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් කස්තිරමක කොටසකි
   iii. මාත්‍රා 2 + 4 දෙතිතට අයත් කස්තිරමක කොටසකි
   iv. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් අඩව්වක කොටසකි

32) "ඉතිං කියන්නේ තුන්වෙනි වරට නටන්නේ" මෙම කවිය අයත්වන්නේ
   i. කෝලම් නාටකයටය   ii. රූකඩ නාටකයටය
   iii. නාඩගම් නාටකයටය   iv. සොකරි නාටකයටය

33) "ජෙං තත් තත් ජෙං තත් තත් ජෙං තත් තත් ජෙංතා" මෙය
   i. තුරඟා වන්නමට අයත් අඩව්වකි
   ii. සැවුලා වන්නමට අයත් අඩව්වකි
   iii. මුසලඩි වන්නමට අයත් අඩව්වකි
   iv. සිංහරාජ වන්නමට අයත් අඩව්වකි

34) ආචාර්ය පණීභාරත ශූරීන් විසින් නිර්මාණය කරන ලද නර්තනය වේ
   i. පන්නෙලීම හා සුරඹාවල්ලිය   ii. ගොයම් කැපීම හා නාරිලතා
   iii. පන්නෙලීම හා ගිරිදේවි   iv. ගොයම් කැපීම සහ අස්නෙ

35) නම වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ
   i. දෙපැති සරඹයයි   ii. අංගහාර සරඹයයි
   iii. දෑත පෑගීමේ සරඹයයි   iv. බඹර සරඹයයි

36) මෙම අඩව්වේ හිස්තැනට අයත් පද කොටස් තෝරන්න
   තාං පිං තත් තත් ……………… දොහොකඩ තහකඩ ………………..
   පිං තෙහිං ……………………… තහර්පිත් තහර් දොං
   i. පිං තත් පිං තත් තත් - දොම්කිට කුඳ ගත කුකුඳ - තහර්පිත් තහර්පිත් කුඳ
   ii. දොම්කිට කුඳ ගත - පිං තත් දොහොකඩ තහකඩ - තහර්පිත් කුඳ
   iii. ජෙහෙකඩ තහකඩ - ගත කුකුඳ - දොම්කිට දොම්කිට කුඳ
   iv. පිං තත් දොම්කිට - දොම්කිට කුඳ ගත කුකුඳ - තහර්පිත් දොම්කිට

37) උඩරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂිත වචන ලෙස සැලකෙන්නේ
   i. කස්තිරම, සීරුමාරුව හා ගොඩ සරඹ
   ii. කස්තිරම, සීරුමාරුව හා යක්කම්
   iii. යක්කම්, වන්නම් හා ඉරට්ටිය
   iv. කලාසම, වන්නම් හා අඩව්ව

38) "දො දොංත තකු දොම්" යන බෙර පදය වාදනය කරන වන්නම වන්නේ
   i. කිරලා වන්නම   ii. සැවුලා වන්නම
   iii. සිංහරාජ වන්නම   iv. නෛයඩි වන්නම

39) හාවාගේ හැසිරීම් රටා ප්‍රස්තුතය කොට ගෙන රචනා වී ඇති වන්නම
i. මුසලඬි වන්නම
ii. ගාහක වන්නම
iii. ගජගා වන්නම
iv. සැවුලා වන්නම

40) කොහොඹයක් කංකාරි ශාන්ති කර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි දෙකකි
i. යක්කම් හා යක්තුම් පදය
ii. ගුරුගෙමාලාව හා යක්කම්
iii. ඌරා යක්කම හා අස්නය
iv. පළවැල දානය හා යක් ඇනුම

## පහතරට නර්තනය

31) දොංත ගත්තං ගදිත ගත්තං ගත ගුඳන් ගතගගගග මෙය
i. මාත්‍රා 3 + 4 දෙතිතට අයත් ඉරට්ටියක කොටසකි
ii. මාත්‍රා 2 + 4 දෙතිතට අයත් ඉරට්ටියක කොටසකි
iii. මාත්‍රා 3 + 3 තනි තිතට අයත් ඉරට්ටියක කොටසකි
iv. මාත්‍රා 4 + 4 තනි තිතට අයත් ඉරට්ටියක කොටසකි

32) ආලවෙලා පියසේ පටන් ……….. මෙම කවිය අයත් වන්නේ
i. සොකරි නාටකයට
ii. රූකඩ නාටකයට
iii. නාඩගම් නාටකයට
iv. කෝලම් නාටකයට

33) දොම් තත් දිම් ගත ගුගුඳිත ගගග මෙය
i. අනුරාගදණ්ඩ තාලයට අයත් ඉරට්ටියකි
ii. නාතිලිංචි තාලයට අයත් ඉරට්ටියකි
iii. භවාදි තාලයට අයත් ඉරට්ටියකි
iv. ලලිතරාග තාලයට අයත් ඉරට්ටියකි

34) කේ. එස්. ප්‍රනාන්දු මහතා විසින් නිර්මාණය කරන ලද නර්තන අංග
i. ගිරිදේවි හා පන්නෙලීම
ii. ගිරිදේවි හා සුරමාවල්ලිය
iii. ගිරිදේවි හා ගෙප්පි මාත්‍රය
iv. තෙල්මේ හා සුරඹාවල්ලිය

35) නමවන ඉලංගම් සරඹය වන්නේ
i. දොංගත දිත ගතගත් දැහිංය
ii. ගුං දැහිං ගුං දැහිං ගත් ගත් දොං ය
iii. තරිකඩ දිරිකඩය
iv. ගුහිතිගදිරිකට ගුඳ ගුඳ ගුං දිත් තා

36) මෙම ඉරට්ටියේ හිස් තැනට අයත් පද තෝරන්න
ගුං දත් …………………… ගත ගත …………… තත් දිත් තත් ………………
i. ගුහිතිග දිරිකිට - ගහිති ගතම් - දිගතම් දොං
ii. දිරිකිට තත් - දිත ගුඳ - රෙගුඳ ගතං
iii. දොම්ත ගදිත - ගත ගුඳ - ගත් දිත් තා
iv. ගදිගත - තකු තත් - දිත ගුඳ තා

37) පහතරට නර්තන සම්ප්‍රදායට අයත් පාරිභාෂිත වචන ලෙස සැලකෙන්නේ
i. ඉරට්ටිය, සිංදු වන්නම්, ඉලංගම් සරඹ
ii. පා සරඹ, ඉරට්ටිය, ගොඩ සරඹ
iii. යක්කම්, ඉරට්ටිය, අඩව්ව
iv. කලාසම, ඉරට්ටිය, අඩව්ව

38) "ගති කිට ගති ගත දොං" යන බෙර පදය වාදනය කරනු ලබන සිංදු වන්නම වන්නේ
i. නාතිලිංචි තාලය
ii. ශුද්ධ තාලය
iii. හනුමන්තා තාලය
iv. අනුරාගදණ්ඩ තාලය

39) මේවායින් සිංදු වන්නමක් නොවන්නේ
i. සරල කවි තාලය ii. නාචි ලිංචි තාලය iii. ශුද්ධ තාලය තාලය iv. හනුමන්තා තාලය

40) දෙවොල්මඩු ශාන්ති කර්මයේ අන්තර් ගත නාට්‍යමය පෙළපාලි දෙකකි
i. තොරන් යාගය හා මී බන්ධනය
ii. ඇත්බන්ධනය හා අඹවිදමන
iii. යහන් දැක්ම හා පත්තිනි
iv. දෙවොල් ගොඩ බැසීම හා ආවැන්නුම

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | විෂය - නර්තනය | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..................................................................................................................................

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

( 01 )

i. පහතරට දෙවොල් මඩුවේ විචිත්‍රවත්ම රංග වස්ත්‍රාභරණ කට්ටලය වන්නේ ..................... ඇඳුම් කට්ටලයයි.
ii. කුඹී කතාව මුද්‍රා නාට්‍යයේ රංග රචනය කරන ලද්දේ .................... විසිනි.
iii. ග්‍රහපන්ති කවි ගායනා කරනු ලබන්නේ ......................... ඇතිවන දෝෂ දුරු කිරීමේ අරමුණිනි.
iv. සකපෝරුව ..................... කර්මාන්තයේදී භාවිතා කරන උපකරණයකි.
v. "තිත් මුවෙක් ඇත මුව දෙනක් ඇත...." මෙම රබන් පදය ................... තිතට වාදනය කරනු ලබයි.
vi. වේදිකා සැරසිලි ආලෝක කරණය ...................... අභිනයට අයත් වේ.
vii. සුලකු ද්‍රවිඩ ගැමි නර්තනය දේශීය ගැමි නර්තනවල ........................... නර්තනයට සමානවේ.
viii. උඩරට ගොඩසරඹ සඳහා පහතරටදී භාවිතා කරන නාමය ......................... නමින් හඳුන්වයි.
ix. උඩරට වන්නම් මහනුවර ................... මඩුවේදී හා පහතරට සිංදු වන්නම් දෙවුන්දර ................. දේවාලයේ රචනාකල බව සඳහන් වේ.
x. කථකලි නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ගායකයා ................... නමින්ද අනු ගායකයා .................. නමින්ද හඳුන්වයි.

( 02 )

i. මාත්‍රා 2+4 තාල රූපයට බෙර පදයක් ප්‍රස්තාර කරන්න.
ii. යුද්දෙටත් ඇවිත්.... යන කවියේ පද දෙකක් මත්‍රා තුනේ තනි තිතට ප්‍රස්තාර කරන්න.
iii. සිංහරාජ වන්නමේ අඩව්ව හෝ අනුරාගදණ්ඩ තාලයේ ඉරට්ටිය ප්‍රස්තාර කරන්න.

( 03 )

i. භාව ප්‍රකාශනයේ දී ශරීරය බෙදෙන ප්‍රධාන කොටස් 3 නම් කරන්න.
ii. ශාන්ත (ශම) ස්ථායි භාවය නිරූපණයේදී ඇතිවන රසය කුමක්ද?
iii. ශාන්ත රසය උද්දීපනය සඳහා මුල්විය හැකි දෘශ්‍යමාන අවස්ථා 3 ක් ලියන්න.
iv. ශාන්තභාවය නිරූපනයේදී මුහුණ තුලින් දැකිය හැකි ලක්ෂණයන් 4 ක් ලියන්න.


( 04 )

i. කථකලි හා කථක් නර්තන සම්ප්‍රදායන් සඳහා භාවිත සංගීත සම්ප්‍රදායන් දෙක නම් කරන්න.
ii. කථකලි හා කථක් නර්තන සම්ප්‍රදායන්ට අයත් රංග වස්ත්‍රාභරණ කට්ටලයන් හි කොටස් දෙක බැගින් නම් කර පළඳින ස්ථානද ලියන්න.
iii. කථකලි නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩ 3 ක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

( 05 ) පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

i. සතර අභිනය.
ii. ගැමි නාටක.
iii. පංචතූර්ය වාදනය.
iv. අණ බෙර.
v. ගැමි නැටුම්.
vi. වජිරා චිත්‍රසේන.

( 06 ) දේශීය මුද්‍රා නාට්‍ය කලාව ඇසුරින් පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.




**හරහට**

1 චිත්‍රසේන මහතා නිර්මාණය කරන ලද මුද්‍රා නාට්‍යකි.
4 ලංකාවේ නිෂ්පාදිත ප්‍රථම මුද්‍රා නාට්‍ය.
8 වසන්ත කුමාර මහතාගේ මුද්‍රා නාට්‍යකි.
9 නර්තන කලාව සමග සෘජුවම සම්බන්ධතා දක්වන නාට්‍ය ක්‍රමය.
11 මුද්‍රා නට්‍යයේදී භාවිතා නොවන අභිනයකි.

**පහළට**

2 ප්‍රේම කුමාර මහතාගේ මුද්‍රා නාට්‍යයකි.
3 වජිරා චිත්‍රසේන මහත්මිය පණපෙවූ චරිතයකි.
5 ශ්‍රී පාලියෙ මුල්ගල තැබීමට 1934 පැමිණියේ.
6 මුද්‍රා නාට්‍ය සඳහා භාවිතා කළ නමකි.
7 වජිරා චිත්‍රසේන මහත්මියගේ මුද්‍රා නාට්‍යකි.
10 අපරදිග මුද්‍රා නාට්‍ය මෙසේ හඳුන්වයි.

( 07 ) 1934 රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ පැමිණීමත් සමග නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇති විය.

i. නර්තන කලාවේ ඇති වූ නව ප්‍රබෝධය නිසා සිදු වූ ප්‍රවණතා 3 ක් ලියන්න.
ii. අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදුවූ ප්‍රවණතා 4 ක් ලියන්න.
iii. සමාජ අවශ්‍යතා සඳහා බිහිවූ ආයතන සහ නර්තන කණ්ඩායම් නම් කරන්න.

**මතුගම අධ්‍යාපන කලාපය**

**නර්තනය - 11 ශ්‍රේණිය**

**2023**

පිළිතුරු පත්‍රය

**බහුවරණ පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| (01) - 3 | (11) - 2 | (21) - 4 | (31) - 1 |
| (02) - 4 | (12) - 3 | (22) - 3 | (32) - 4 |
| (03) - 1 | (13) - 2 | (23) - 4 | (33) - 2 |
| (04) - 3 | (14) - 3 | (24) - 3 | (34) - 2 |
| (05) - 1 | (15) - 1 | (25) - 4 | (35) - 3 |
| (06) - 4 | (16) - 2 | (26) - 4 | (36) - 1 |
| (07) - 1 | (17) - 2 | (27) - 3 | (37) - 1 |
| (08) - 3 | (18) - 1 | (28) - 2 | (38) - 3 |
| (09) - 2 | (19) - 3 | (29) - 4 | (39) - 1 |
| (10) - 3 | (20) - 3 | (30) - 1 | (40) - 2 |

( මුළු ලකුණු 01 x 40 = 40 )

---

**II කොටස**

(01)

i. තෙල්මෙ
ii. අංජලිකා චිත්‍රසේන
iii. ග්‍රහයින්
iv. මැටි
v. මැදුම් මහ (3+4)
vi. ආහාර්ය අභිනය
vii. කුළු
viii. ඉලංගම් සරඹ
ix. කවිකාර / උපුල්වන්
x. පොන්නානි / ශිංකිඩි

(i)සිට(viii)දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 08 යි.
(ix)සිට(x)දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි. ( මුළු ලකුණු 12 )

(02)

i. අදාළ තිත් මාත්‍රය අනුව බෙර පදය ප්‍රස්තාර කිරීම ( ලකුණු 03 )
ii. මාත්‍රා 3 තිතට කවි පද දෙක ප්‍රස්තාර කර ඇත්නම් ( ලකුණු 04 )
iii. නියමිත තිත් මාත්‍රය අනුව ප්‍රස්තාර කර ඇත්නම් ( ලකුණු 05 )

(03)

i. අංග , ප්‍රත්‍යාංග , උපාංග ( ලකුණු 03 )
ii. ශාන්ත රසය ( ලකුණු 02 )
iii.
- ❖ බුදු රුවක් දැකීම
- ❖ පන්සල් භූමියේ වන්දනා කිරීම
- ❖ භාවනා කිරීම ( ලකුණු 03 )

iv.

- අඩවන් වූ දෙනෙත
- දෙනෙතින් පළවන උපශාන්ත බව
- පිරිගිය දෙකොපුල
- පහත් වූ ඇහිබැම
- සමතුලිත නලල් තලය
- එක ඉරියව්වක පිහිටීම ( ලකුණු 04 )

(04)

i. කථකලි - කර්ණාටක සංගීතය

කථක් - හිංදුස්ථානී සංගීතය ( ලකුණු 02 )

ii. කථකලි :-

කිරිටම් - හිස් ඔටුන්න

කළු තාරම් - කරට පළඳින මාල

කුප්පායම් - අදත් දිග හැට්ටය

උත්තරියම් - කර වටා ඉණ දක්වා එල්ලා ඇති සුදු හා රතු පටි අගට රවුම් කණ්නාඩියක් සවිකොට ඇත

ඥෝරි - යටි කයට අඳින විශාල රෙද්දකි

කථක් :- ධෘපට්ටා - හිසට වේලය
සග්‍රාවෝලි - දිග සාය
චූර්දර්පජාම - පිජාමා
ගුංගුරු - ගෙජ්ජි ( ලකුණු 04 )

iii. චෙන්ඩාව , මද්දලය , චෙන්ගිලම් , ඉලතාලම් , එඩැක්ක

වාද්‍ය භාණ්ඩ නම් කර ඉන් එකක් පිළිබඳ හැඳින්වීමක් කර ඇත්නම් ( ලකුණු 06 )

(05) මාතෘකා 3 ක් කෙටියෙන් විස්තර කිරීම සඳහා ( ලකුණු 4 x 3 = 12 )

(06) ප්‍රෙහේලිකාව :-

| **හරහට** | **පහළට** |
|---|---|
| 1 - කරදිය | 2 - දියවන්නාව |
| 4 - සීතාහරණ | 3 - සිසි |
| 8 - තම්බපණ්නි | 5 - රබින්ද්‍රනාත් |
| 9 - මුද්‍රා නාට්‍ය | 6 - නෘත්‍යනාටක |
| 11 - වාචික | 7 - කුමුදුනී |
| 10 - බැලේ | |

( ලකුණු 12 )

(07) i.

- අධ්‍යාපනික වශයෙන් ඇති වූ නව ප්‍රවණතා
- සමාජ අවශ්‍යතා හා ආකල්ප මත
- ප්‍රාසාංගික කලාවක් ලෙස
- නව තාක්ෂණික ක්‍රමෝපායන් පදනම් කරගෙන
- විවිධ සංස්කෘතින්ගේ බලපෑම ( ලකුණු 03 )

ii.

- 1972 රජයේ පාසල් වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වීම
- 1936 ගාන්ධර්ව සභාව ආරම්භ කොට ගාන්ධර්ව විභාගය ආරම්භ වීම
- 1943 ප්‍රථමයෙන් පාසල් වල නර්තන විෂය ඉගැන්වීම ආරම්භ වීම
- 1952 රජයේ ලලිත කලායතනය ආරම්භ කිරීම
- 1956 සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කිරීම ( ලකුණු 04 )

iii.

ආයතන :-

- සංස්කෘතික මධ්‍යස්ථාන
- ජාතික තරුණ සේවා සභාව

නර්තන කණ්ඩායම් :-

- රාජ්‍ය නර්තන කණ්ඩායම
- ත්‍රිවිධ හමුදා පොලිස් නර්තන කණ්ඩායම්
- පළාත් නර්තන කණ්ඩායම්
- පෞද්ගලික නර්තන කණ්ඩායම්

( ලකුණු 05 )



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න